*Stringed, Wind, Percussion instruments players, Telapatta jataka,Mulkirigala rajamahavihara.Man spellbound by she-demons in the guise of Musicians. The Bodhisattva stands outside the house.*





*Figure 13:*
*Music players , Representation of the tooth- relic temple in Kandy, Sailabimbarama, Dodanduva*

# CHAPTER 4
# Musical Instruments of Today

Musical instruments which are often played in different occasions today is mentioned in this chapter. Capacity of producing sound varieties, methodology of playing, medium of each instrument, occasion of use and historical evidence of each instrument are explained in order to disseminate comprehensive knowledge of the subject.

***Geta Beraya* - (Wedding Drum)**



This drum generates two different sounds. It is played with free hands on ceremonial occasions. It's made with *'Asala', 'Kohomba'* or *'Kos'* timber. In order to generate two different sounds, the left of the drum is made with cowhide



and the right, with monkey skin (lives around *dummala* trees) and bound tightly with tough leather. *Geta Beraya* is well depicted in the *Panavitiya Abbalama* wood carvings.

***Yak Beraya***



*Yak beraya* is made from the timber of the *Kithul* tree. This instrument is played using the free hand and is about 3 feet in length. It is mainly used in the lower country of Sri Lanka for *Thowil* and the *perehares* (procession).

***Dawula***



This drum is made using *Kithul* timber. They are decorated with exquisite art and brass strips. Cowhide is used and is played with a stick called *'Kaduppu'*.

### *Udakkiya*



This instrument is shaped like a sand clock. *Udakkiya* is made by carving either the *Suriya* or *Ahala* timber into two apertures. *Udakkiya* is played with 2 sticks called *'Walayan'*. The pitch of the sound can be changed by applying pressure on the twine with a bound cloth.*Lovamahapaya* pillar summit shows the *Udakkiya* instrument.



### *Bummadiya*



*Bummadiya* is made with clay in the shape of a '*kala gediya*' (a kind of pot used to carry water). Both the sides are made into 2 apertures and pasted with 2 leather skins.

*Bummadiya* is used in the songs of the farmers when harvesting paddy. This is also called "*Kalaham*" or "*kalaberaya*".

## *Thammattama*





This instrument is made with either the root of the *Kithul tree* or any other suitable timber. The root or the timber is crafted in the shape of a *'walanda'* (Pot). Secondly both the left & the right tops are bound tightly by cow leather. This drum is played with 2 *'kadappus'* (2 sticks). Temple murals of Mulkirigala of 18th Century AD show *thammattama* players.



## *Rabana*



*Rabana* is about one foot in diameter. This instrument is also carved out of wood. The leather is stretched over the rim of the wooden drum and is hammered with nails.

*Rabana* used for dancing, and used for rotating for the presentation, *Virindu rabanna* and *rabanna* which is consisted of wide diameter are different kinds of *rabanas,* used in Sri Lanka.

## *Horanewa*



*Horanewa* is known as Sri Lanka's version of the oboe is an instrument made of the elephant tusk with its backend adorned with brass. The base is riddled with small holes to enable varying pitches when it is played.





*Horanewa player at the Temple of the Tooth, Kandy*

# Bibliography


- Brendon R.J. 1974. The performing arts in Asia, Unesco, Paris.
- Chandrasiri O, Ven 2014, the poetical works and the poetic languadge during the British period in Sri Lanka, Journal of Royal Asiatic Society (C. B), New series, Vol 59 part I.
- Coomaraswamy, A. 1956, Meadival Sinhalese Art. Published by the National Museum. Sri Lanka.
- da Silva, Cosme. O.M.1990. Fidalgos in the Kingdom of Kotte 1505-1656. Colombo:Harwoods
- Davy, J. 1821. An Account of the Interior of Ceylon and of Its Inhabitants, London: Longman
- De Silva, S. Jayasuriya, and Wijetunge, R. 1998. Portuguese Borrowings in Sinhala. Journal of Royal Asiatic Society (C. B), New Series,Vol. XLIII.
- Deraniyagala, P.E.P. 1959, Some Sinhalese Combative, Field and Aquatic Sports and Games,Published by National Museum of Colombo.
- Dewaraja, L. S. 1988 Sec. ed. The Kandyan Kingdom of Sri Lanka 1707-1782. Pannipitiya: Stamford Lake (Pvt) Ltd.
- Dissanayake W, 2005, Enabling Traditions, Visidunu Prakashakayo.
- Dolapihhilla, P, 2006, In the Days of Sri Wickramarajasingha, Rathmalana: Vishva Lekha.
- ප්‍රේමතිලක නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම නිමල් ප්‍රේමතිලක සහ පුත්‍රයෝ
- Godakumbura C.E. Sinhala Dance and Music, Colombo: Archeological Department,1983.
- Hulugalle, H.A.J. 1999. Ceylon of the early travelers. Arjuna Hullugalle Dictionaries.





- Jayathilaka, D.B. 1941.Sinhalese Embassy to Arakan, Journal of Royal Asiatic Society (C. B),XXXV.
- Kantawala M.H. 1921 - 1922 Sinhalese and the Aryan Languages, C. A. L. R. Vol 7.
- Kulathilake C.De.S, 1984/85, Raban Sellima and its Music, Journal of royal Asiatic Society (C.B.) Colombo, Vol XXIX.
- Kulathilake C.De.S. Abeysighe R. 1976 A. Background to Sinhala Traditional Music of Sri Lanka, Department of Cultural Affairs Sri Lanka.
- Kulathillake C. de S. Ethnomusicology and Ethnomusicological aspects of Sri Lanka, Colombo: S. Godage& Brothers,1991.
- Kulathillake C. de S. Musical instruments in Sri Lanka's History, Department of Cultural studies.
- කුලතිලක සී.ද.එස්. 1974, ලංකාවේ සංගීත සම්භවය, ඒස්. ගොඩගේ සහ සහෝදරයෝ
- කුලතිලක සී.ද.එස්. 1981 ජන සංගීත සිද්ධාන්ත, කොළඹ වෛද්‍ය රන්ජන් අබේසිංහ
- කුලතිලක සී.ද.එස්. 1982. දහ අට වන්නම A publication of the Music research Unit, Sri Lanka Broadcasting Corporation.
- කුලතිලක සී.ද.එස්. 1987 විශ්ව සංගීත ක්ෂේත්‍ර, චීන, ඉන්දීය, ඉස්ලාමික, බටහිර සහ ගැමිලෑන් සංගිත පද්ධති පහ ගැන විමර්ශනයක්, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
- කුලතිලක සී.ද.එස්. 1999 ජන සංගීත සිද්ධාන්ත, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- කන්නංගර සරෝජා, 1997, සංගීතය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ
- ප්‍රනාන්දු රංජිත්, පී.ඩී, 2003, සංගීතවේදය, මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක් කර්තෘ ප්‍රකාශනයකි.
- Magul – Bera, Three Nelum Singers and Fertility and Sex Symbolism in the Ritual Drama of Sri Lanka Institute of Aesthetic Studies, Kelaniya University.
- පංචාංගික තූර්ය සංකල්පය, 1991, ශ්‍රී ලංකා කලා මණ්ඩලය කලා සඟරාව, 39 කලාපය, දෙසැම්බර් 06.

- Paranavitana, K.D. trans.1997.Journal Of Spilbergen:the first dutch envoy to ceylon 1602.Published by the Author.
- Perera M.G. 1930, Saptaswara, The Seven Musical notes (M.D. Gunasena)
- Pieris, P.E, 1945,A report on Buddhism in Siam-1689 AD Journal of Royal Asiatic Society (C. B), vol XXXVI, No.99,1945.
- Pieris, P.E. 1992. Ceylon the Portuguese Era. Vol.1. Tisara Prakasakayo.Senevirathne Anuradha, Sanskutiyasaha kala silpa,1981.
- රත්නායක ඇල්. ඩී.ඒ. 1946, සංගිත ඉතිහාසය
- රාජපක්ෂ වෛද්‍යවතී. 2002 දළදා මාළිගාව සහ තූර්ය වාදනය එස්.ගොඩගේ සහ සහෝදරයෝ
- රාජපක්ෂ වෛද්‍යවතී, 2002 උඩරට තූර්ය වාදන පුරාණය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ
- Roberts, M.Raheem, I.Colin-Thome, P. 1989.People In between.Sarvodaya Book Publishing Services.
- Silva, de K.M, 2005 (The first Sri Lankan Edition). A History of Sri Lanka.Colombo: VijithYapa Publications.
- Tylor E.B.1913. Primitive Culture.London
- මලල්ගොඩ, සුගතදාස, 1991, යක් බෙරය, ඇස් ගොඩගේ සහෝදරයෝ
- University of Ceylon, History of Ceylon,Colombo 1959, Vol I part I.
- University of Ceylon, History of Ceylon,Colombo 1960, Vol 1, part II.
- W Arthur De Silva 1915-1916 the Popular poetry of the Sinhalese, Journal of royal Asiatic Sosiety (C.B.) Vol XXIV, No 68, Part I.


# Index


**A**

Agricultural songs 25, 27
Ahala timber 58
Aryan colonization 16

**B**

Bhuvanaika Bahu V 19
body movements 24
British 17, 18, 31, 64
Buddhism 17, 24, 33, 65
Bullock cart verses 25, 28
Bummadiya 59

**C**

ceremonial occasions 56
colonial occupation 17, 40
common culture 18
common religion 18
conch 45
cowhide 56
cultural dresses 32
cultural habits 19, 20, 23
Culture 15, 22, 65
customs and rules 19
cymbal (talampota) 46

**D**

daladageivijjatun 34
Dambadeniya asna 40
dancing 24, 33, 34, 35, 61

Dawula 57
Devolyaga 35
dress 20, 22
drums 24, 35, 47, 48
dummala trees 57
Dutch 17, 20, 21, 65

**E**

Elephant lamp from Dedigama 46

**F**

fiddle 43
flute 46
Folk music 24, 25
folk songs 25, 30, 31
food 20, 21, 23

**G**

Galpatha viharaya 46
Games 25, 29, 30, 64
Geta Beraya 56, 57
Guttila Kavya 41

**H**

hakgedi-appu 45
Hakgedi-muhandiram 45
hatankavya 35
Hinduism 34
History of Musical Instruments 40
Horanewa 62
hunting rituals 24
hybrid formation 22



**I**

Indian influences 16, 17

**K**

Kaduppu 57
kalaberaya 59
Kalaham 59
kandavuru sirita 34
Kantakachetiya 45
karnataka musicians 35
kavikaramaduwa 34, 35
Kavyasekaraya 40
King in theory 19
King Kirthi Sri Rajasimhe 31
King Narendrasimhe 29, 35
King Parakramabahu I 34
King Sri Wikrama Rajasimha 18
Kithul tree 57, 60
Kohomba 56
kohomba kankariya 35
Kos 56
Kotte Kingdom 17
Kotte period literature 41
Kovul Sandesaya 41
Kunstantinu hattana 40
Kuveniasna 40

**L**

Language 20
living culture 18
Lovamahapaya 41, 45, 46, 58
lullabies 25
lute 40, 41, 42

**M**

mahasaman devala 35
Mahavamsa 16, 34
Mahayanism 33, 34
medium of each instrument 56
methodology of playing 9, 56
monkey skin 57
Mulkirigala 43, 46, 52, 53, 54
Multicultural values 21
Musical Instruments of Today 56
musical variations 24
Music Tradition 16, 24

**N**

Natarajha statue from pollonnaruwa 45
Nelunkavi 25, 27
Netum Illungama 35
North India 16

**O**

occasion of use 56
Ordinary knowledge 15

**P**

Pal kavi 25, 26
Pana-bera 47
Panavitiya Abbalama wood carvings 57
panchathurya nada 34
panegyrics 35
Parakramabahu II 34
Pareve Sandesaya 41
pasaturugosa 40
Percussion 41, 47, 54



Perehares 47
plectrum, kona 41
Poems 25, 30
Political constitution 16, 22
Portuguese 17, 20, 21, 64, 65
Prasashthi 35
priests 18
processions 47
purampettu 35
Purva-rama temple in Kataluwa 43
Puzzles 25, 28

**R**

Rabana 61
ragam 35
rajageivijjatun 34
Rattles and Strikers 46
Ravikinne 43, 44
Royalty 17

**S**

Sabaragamu 35
Sakdura 45
Sanskrit terms 20
savdam 35
sensual art 33
Shanka 45
Siamese 17, 20, 21
Sigiriya frescos 41, 42
sindu 35
singing 24, 35, 41, 47
sinharakkara division 35
Society 64, 65
Songs associated with Mines 25, 28

Songs :merit of the pilgrimage 25
sounds 24, 47, 56
sound varieties 56
South Indian Influences 17
Sovereignty 18
Stringed Instruments 41

**T**

Tamil Nayakkar 18
Telwatta 43
thamberu purampettu kara division 35
thamboru 40
Thammattama 60
Theravada Buddhism 33
thomberu 35
Thowil 47, 57
timeless qualities 14
Tisara sandesa kavya 40
tooth relic 34
tradere 13
Tradition 9, 11, 13, 16, 23, 24
Traditional knowledge 15
traditional notion 22
traditional values and norms 19
traditum 13
transcendental experience 15
transcendental phenomenon 14
transcendental vision 15
transmissible parts 14
trickled down 20
Trumpet 46



**U**

Udakkiya 47, 58

upaveenaya 41

**V**

Vamsattappakasini 40
vannam 35
vasala illangama 35
vasdandu 46
veena 41, 43
Verses of the tunsarana 25
Vesnatum 35
Vijaya 16, 18
viraha gee 35
Viridu 25

**W**

Walayan 58
Walter Benjamin 16
Wasp bees verses 25
Western influences 17

**Y**

Yapahuwa dados 46

# APPENDIX

## ජන සංගීතය පිළිබඳව ජගත් ලේඛකයන් දක්වා ඇති අදහස් ස්වල්පයක්...

Art music is the work of the Individual, and expresses his own personal ideals and aspirations, it is composed in, comparatively speaking a short period of time, and by being committed to paper it is forever fixed in one unalterable form. Folk music on the other hand is the product of a race, and reflects feeling and tastes that are communal rather than personal, its creation is never completed, while at every moment of its history it exists not in one form but in many.

(C.J. Sharp.'English Folk Song')

(රසික සංගීතය වූ කලී පෞද්ගලික අදහස් හා සිතුම් පැතුම් ප්‍රකාශ කරන්නා වූ, තුලනාත්මකව සලකා බැලීමේ දී කෙටි කාල පරිච්ඡේදයක් තුළ රචනා කරන ලද්දකි. ලේඛනගත වීම නිසා එයට ස්ථාවර ආකෘතියක් ද වෙයි. එහෙත් ජන සංගීතය පෞද්ගලික බවෙන් තොර සාමූහික හැගීම් දනවන, ජාතියක් සතු වූ වස්තුවකි. එහි නිර්මාණ කාර්යය කිසිවිටෙක සමාප්තියට පත් නොවේ. ඉතිහාසයේ සෑම මොහොතකදීම එය ඒකායන ආකෘතියක් ලෙසට නොව විවිධ ස්වරූපයෙන් පරිණාමය වන්නේ වෙයි)



No greater mistake was ever made than to suppose that ballads survive best among the most illustrate and ignorant.

(F.H. Eckstrom and P. Barry, What is Tradition)

(ජන ගීත අවිදග්ධ නූගතුන් අතර පවතින ගීත යැයි යන දුර්මතය තරම් බොළඳ අදහසක් තවත් ප්‍රකාශ වී නොමැත)

Folk music is natural music. In its making it is not controlled by the conscious application of conventional rules and restrictions.

(C.J. Sharp, Some Characteristics of English Folk music)

(ජන සංගීතය යනු ස්වයං සිද්ධ සංගීතයකි. එහි වැඩී ම ගතානුගතික රීති හා සම්බාධක විසින් පාලනය වන්නේ නැත.)

Folk lore material thrives in society in which there are people of considerable native intelligence artistic appreciation, memory, imagination and creative urge who can comprehend value, remember and recreate their native folk - lore and thus propagate it as an a living tradition.

(R.S. Boggs 'Materials Science and Art of folk – lore')

(ජන වේදයට අයත් ධර්මතා සැහෙන ප්‍රමාණයක සහජ බුද්ධියක් ඇති, කලාත්මක වින්දනය, ස්මෘතීන්, පරිකල්පනය, නිර්මාණාත්මක පෙළඹවීම් සහ යමක් අවබෝධ කරගෙන ඇගයීම සහ මතකයට නගා පුනර් නිර්මාණය කොට ජීවමාන සම්ප්‍රදායක් ලෙස ප්‍රචාරණය කළ හැකි සමාජයක බැඳී පවතී.)

(කුලතිලක සී. ද ඇස්. 1981, ජන සංගීත සිද්ධාන්ත, කොළඹ : වෛද්‍ය රන්ජන් අබේසිංහ, 5, 6, 7 පි.)



**Instruments from Pillar capitols near Ruvanveli stupa,Anuradhapura.Veena,Drum,Flute,conch,pana-bera,Kumbha-bera( Kulathilake C.De .S,Musical Instruments in Sri Lanka's History,Department of Cultural Affairs,39 p)**





**Harp-Veena Player-4th century frieze,Colombo Museum. (Kulathilake C.De .S,Musical Instruments in Sri Lanka's History,Department of Cultural Affairs,45 p)**



**Instrument from Mahiyangana relic chamber. (Kulathilake C.De .S,Musical Instruments in Sri Lanka's History,Department of Cultural Affairs,45 p)**





**Musicians from Mulkirigala-early 19th Century.( Kulathilake C.De .S,Musical Instruments in Sri Lanka's**



**Veena Player - Murals from Dova Temple (Chatiwongs N.,et.al, 1990, Paintings of Sri Lanka Colombo: Archiological Survey of Sri Lanka, Central Cultural Fund)**





**Veena Player - Murals from Hanguranketa Temple (Chatiwongs N.,et.al, 1990, Paintings of Sri Lanka Colombo: Archiological Survey of Sri Lanka, Central Cultural Fund)**

## බෙර උපත කවි

කොසඹ දේවදුරු ගන් සූරිය කඳ ගත්තයි පළමුව මේ ලෙසි නා
ඇතුල පිටත මැද වාසය කරමින ඉර සඳ දෙවියෝ මේ ලෙසි නා
මඟ යන බගවත සැනෙකින් ඇවිදින් තට්ටුව ගෙන සැදූ මේ ලෙසි නා
සිරස මුදුන පටලා තිබූ රොහොමය ඉල්ලමකට බැඳ සැදූ රුවි නා

සම දිගු පුළුලද ගත්තයි සුබ ලෙස දෙවියන් ඉසිවර වර ලෙසි නේ
නේර්තය නරනා දැන් නිසි ඇදුරා නැගෙනහිරින් සිට බලාගෙ නේ
දහ සයගුල දික් කඩුවෙන් කපලා කඳ කුමරාගේ සිරි ඇති නේ
මහා පද්මයගෙ කඳයෙන් සම් ගෙන උවරට පට සදලා රුවි නේ

ගත්තු වරපට නිත්ත තට්ටුව ගත්තු තැන කීවොත් වලංගු ය
නිත්ත පෙර ගත් ලී තුනේ නම නොකීවෝතින් වැටෙයි වංදි ය
නෙර්තයට මුල්පද තුනක් ඇත කියා දුන්නොත් මෙහි වලංගු ය
සත්ත නැති ලෙස නිත්ත ඉන බැඳ ගසන්නට බෙර දැන් තහංචි ය

මෙහෙසුරා යන මහා දෙවිඳුගෙ දෙකන්වැල් වරපටට ගත්තු ව
නිත්තමහ පත්මයා කඳසම් ගසා තට්ටුව සදා ගත්තු ව
දේවදාරත් කොසොඹ ගන්සූරියද ලී කඳ සදා ගත්තු ව
නෙර්තකල ඉසිවරුන් හස්තෙන් දිගින තකු, දිකු මවා ගත්තු ව

(සේදරමන් ජේ.ඊ. 1979, උඩරට නැටුම් කලාව, කොළඹ : ඇම්.ඩී. ගුණසේන 39 පි.)



**Musicians - Murals from Kottibulwala Temple (Chatiwongs N.,et.al, 1990, Paintings of Sri Lanka Colombo: Archiological Survey of Sri Lanka, Central Cultural Fund)**





**Drum player, Carvings from Niyamgampaya.**



**Kotte period Musians (16th Century) From Bentara and Ambulugala (Kulathilake C.De .S 1991, Ethnomusicological Aspects of Sri Lanka, Colombo: S. Godage and Brothers.82p)**





**Musicians by 1819. Instruemnts from Davy (1821),**
(පීරිස්, ආර්, සිංහල සමාජ සංවිධානය, විසිදුනු ප්‍රකාශකයෝ, 340 පි)

## උඩැක්කි උපත

සම්මතේ විත්තිය      ය
සුරදෙවි සමග ඇදුරු      ය
පෙර මේ උඩැක්කිය      ය
කව්ද දුන්නේ රඟට ඩැක්කි      ය

සුර සමග එන් උ      න
සිටුවා නොයෙක් ලක්ෂ      න
උඩැක්කිය දිස් උ      න
කියා මිස නොමගසනු එක්සැ      න

දහසක් ඇසින් නෙ      ක
බැළුවයි එසක් දෙවිනෙ      ක
මුහුදෙන් වන් නිසැ      ක
එදා දෙවියෝ දුන්නු ලද දෙ      ක

දල ගජ මන්න      වා
දෙවියන් අතින් කප්ප      වා
ඇදුරු වර ලිය      වා
පසෙක සිටියදි කඳකුමරු      වා

සැටිය සැදි සුර නි      ඳු
දුටිය සලකනු ඇදුරි      ඳු
අටිය වරමින් ඉ      ඳූ
ගැටිය දුන්නේ රාහු අසුරි      ඳූ

සම් දෙකක් සඳා      දුනි
ලනු පට නාථ දෙවි      දුනි
සවරම ඉසුරු      දුනි
හඬේ ඉරටය විෂ්නු දෙවි      දුනි

රජ මගුලට      එදා
එක්වුනු දේව සමු      දා
දල කුමරිඳු      එදා
දුන්දු සන්නස් පැහද පැහ      දා



මහමුනි ඉසි      වරා
නෙර්ථ පල කලසපු      රා
ඩැක්කිය අත      දරා
ගාන්ධර්වය තාල පතු      රා

මරසෙන් බිඳන      දා
බුදු වූ සඳෙහි මුනි      දා
ගඳඹුන් ගැසුන      දා
ඩැක්කි උපතෙක් කියන් පහ      දා

එදා මුල මෙලොව      ට
රජ වුනු එරජ මඟුල      ට
උඩැක්කිය ගෙන සි      ට
වාද තෝරා ගැසිය සිව් සැ      ට

පද රසය වින්      දේ
රෝ දුක් දුරැර සින්      දේ
විස්කම් දෙවින්      දේ
ගිගිරි තාලම් එදා දුන්      දේ

පත්තිනි යන් රැගෙ      න
තම ලඟට කැඳවා      ගෙන
සුබ ආවඩා      ගෙන
උඩැක්කිය එවිට පාවා      දුන

මෙරැගුන් නොදත් ද      න
මෙරඟ මඬලට අවුදි      න
කරණ නෙර්තය දැ      න
මෙලොව විල්විසු මැඬිං ගොස මෙ      න

ශාස්තර මුල සි      ට
දැනගෙන පද නියම කො      ට
බැස මෙරඟ මඬල      ට
නෙර්ත කළ සැටි අසන් පෙර සි      ට

වියත් තුනගුල් දිගින් සහ එහි මුදුන තුන ගුල් රැගත් ඩැක්කි    ය
උගත් ඇදුරන් කරපු යාගෙට ඉසුරු ගෙනදුන් දිවිය ඩැක්කි    ය
රැගත් නළුවන් සර්ව හරනින් සැදී වයමින් තාල ඩැක්කි    ය
සමත් ලෙස ගීනාද සවිදන් තාල ගසමින් නැටුම් දැක්වි    ය

(සේදරමන් ජේ.ඊ. 1979, උඩරට නැටුම් කලාව, කොළඹ : ඇම්.ඩී. ගුණසේන, 37, 38, 39 පි.)



**Uddekki player , Dedigama Kota-vehera**





**Uddekki player, Subhadramara Viharaya, Totagamuva, 1886, Pl CXXVI (Manjusri LTP 1977, Design Elements from Sri Lankan Temple Plantings, Colombo Archaeological Society of Sri Lanka**

## තම්මැට්ටම උපත

මා මුණි ඉසිව          රා
දැන තාල සත පව          රා
සැදූ සැටි පුව ත          රා
පොකුරු බෙරයයි සැදූනි එව          රා

ස දා විතරට යුගල වම සහ දකුණ තම්මැට්ටමක් රුසිව          රු
සොදා ඒ ගනු කිත්ත සරිකොට කඩුප්පුව සදවමින් පිවිතු          රු
න දා සිංහ ගජ කිඳුරු හිමි කොට භේද ලසුගුරු තාල දැනමු          රු
එ දා තම්මැට්ටමක් ගැසූ සැටි විනතනම් කොට රජුට යුතු ග          රු

සකල සිව්ගැට තාල සව්දම් නාදහිමි කොට ගාන්ධර්ව          ය
විපුල රන්දාමයක් ඉනලා බැඳ පසුවරන් පොකුරු භේරි          ය
නිමල සම්මත රජුට ඉදිරිව දිව පිරිස් ගැසු පංච තූරි          ය
එකල තම්මැට්ටමයි ඩෙන් කුඩ දිගින හඬ නගවමින් මිහිරි          ය

(සේදරමන් ජේ.ඊ. 1979, උඩරට නැටුම් කලාව, කොළඹ : ඇම්.ඩී. ගුණසේන 39 පි.)



**Purvarama Viharaya, Katalugoda, Kataluva 1886, Pl CXXVII (Manjusri LTP 1977, Design Elements from Sri Lankan Temple Plantings, Colombo Archaeological Society of Sri Lanka**





**Tammattama player (right), Scene from a procession, Painting of Sunandaramaya,Ambalangoda.**

## දවුල් උපත

| | |
|---|---|
| පළමුව බුදු රුව | න් |
| දෙවනුව දෙසු එදහ | න් |
| තෙවනුව සඟ රුව | න් |
| මෙමං නමදිම් අදර බැතියෙ | න් |

| | |
|---|---|
| පවසන මේ | වදන් |
| වරදක් ඇතොත් මොන | යන් |
| මෙ සබයේ විය | තුන් |
| අසව දෙසියක් සොලස | තාලන් |

| | |
|---|---|
| හරඹ අත් දොළස | ද |
| තාල මැයි යන දෙතිස | ද |
| සවදන් සිව් සැට | ද |
| උගත් ඇදුරනි සිටින් සබැම | ද |

| | |
|---|---|
| හුරු නුහුරු මට | කිය |
| නුහුරේ හුරුව මට | කිය |
| සුරතෙ හුරුව | කිය |
| දෙවැල දෙමිටේ හුරුව මට | කිය |

| | |
|---|---|
| දෙපයේ හුරුව | කිය |
| දෙපිටි පතුලේ හුරුව | කිය |
| දෙඅතේ හුරුව | කිය |
| දෙඅත දසඟිලි හුරුව මට | කිය |

| | |
|---|---|
| මලසන් පොත්ත | යට |
| බාරව සිටින අය | මට |
| කියාලා මිස | මට |
| කව්ද එන්නේ සබේ රැඟු | මට |

| | |
|---|---|
| මෙම දවුලේ කඳ | ට |
| බාරව සිටින අය තු | ට |
| කියාලා මිසම | ට |
| බැරිය නිසි තැන ගන්න නෙර්ත | ට |



| | |
|---|---|
| දවුලේ කඩුප්පුව | ට |
| බාරව සිටින අයම | ට |
| කියාලා මිස ම | ට |
| මෙරඟ එන්නේ කව්ද වාදෙ | ට |

| | |
|---|---|
| පට හුරුව නැටුම | යි |
| පතුල් පෙරළුම හුරුම | යි |
| දෙඅතේ හුරුව වෙ | යි |
| දෑත පෙරළූ දෑත හුරුව | යි |

| | |
|---|---|
| සිද්ධකරණ ලෙසට සුවිසි අසන් කෙයියක් සතුන් නිවන | ට |
| යුද්ධකර වසවතුන් පැරදී ඉන්ට බැරි වී ගියයි එම වි | ට |
| සද්ද කරණා දවුල් නාදය වයන්නට ඔහු සැරසිලා සි | ට |
| සුද්ද ලෙස හෙළුවේ දැකුම් අත එදා මුනිඳුගෙ බුද්ධ මඟුල | ට |



**Dawul players, Painting from Kandyan Tradition**



Dawul,thammattama and horn players, Painting from DambavaTemple. (Chatiwongs N.,et.al, 1990, Paintings of Sri Lanka Colombo: Archiological Survey of Sri Lanka, Central Cultural Fund)





Dawul,thammattama players, Painting from Lihiniyagala Temple. (Dissanayaka SB 1997 Diyathilaka Nuwara. Colombo: Dept of Archeology)

## පන්තේරු උපත

සිත්ලෙස ලොව සැදි චක්‍රවලල් ලා
නෙත් තුන සුරිඳුගෙ නුවරු සියල් ලා
පත්තිනි දෙවිඳුගෙ හලඹ වලල් ලා
ගත්තෙ අතට පන්තේරු වලල් ලා

සැපත පැමිණි මුලුලොවට සියල් ලේ
විපත නොවන කවිපද මෙ සියල් ලේ
අපත නොවන දොස දුරුව සියල් ලේ
උපත කියමි පන්තේරු වලල් ලේ

සදා කලක් නොපවතින මෙමාරු ව
යො දා කියන මේ පදවල සීරු ව
නදා නදින් කළ රජහට පේරු ව
එදා සිටන් පැවතුනි පන්තේරු ව

අසුර සංහාරයෙන් සුරනට අයිති වුනු චක්‍රායුධය ගෙන
මියු රු ගී තාලම් නැටු සුරසෙනග ජයරොසයෙන් මත්ව ගෙන
පවර ලක යුද බිමද එම පෙර සිරිත විජයෙහි පැවැත් විමෙන
මෙයුර පන්තේරුවට උපතකි සතර දත් වියතුන්ට දන්වන

සිරිත උපත ලෙස සිහල රජුන් කල රණබිම ගීනද ගයන කලා
ගනිත අතට මිණි තාලම් නදවට හලඹ වලලුනද කරති සිය ල්ලා
දිමිත දොමිත හඬබෙර ගොස කරලා රඟපාමින් නළු නටති සිය ල්ලා
උපත කියමි පෙර පැවති සිරිතෙ හැටි මඳක් ඉතින් පන්තේරු වල ල්ලා

සිරස ජටා සුදු සේල ලවාලා දෙකන කුන්ඩලා ලා රුවි නේ
දැත රුවන් මල් බන්ඩිද ලාලා සොබන අවුල් හැර බඳ වටි නේ
අඳින සේල මන්තද ඉඟ බබලා දෙපය ගිගිරි මිණි නද දෙමි නේ
සොබන මෙසබ පන්තේරු වලල්ලා ගෙන රඟ දෙමු අපි තුටි සිති නේ





**Instruemnts from Davy (1821)**, (පීරිස්, ආර්, සිංහල සමාජ සංවිධානය, විසිදුනු ප්‍රකාශකයෝ, 341 පි)




**Coomaraswamy, A. 1956,Meadiaval Sinhalese Art,Pantheon, plate XXXIV**





**කිඳුරු කොඩිය, සිල්වා, ටී. එම්. ජී. එස්., 2001, ලක්දිව පුරාණ කොඩි, සූරිය ප්‍රකාශකයෝ, පි 24**



**තම්බෙරු පුරම්පෙට්ටුකාර මුහන්දිරම් කොඩිය, සිල්වා, ටී. එම්. ජී. එස්., 2001, ලක්දිව පුරාණ කොඩි, සූරිය ප්‍රකාශකයෝ, පි 46ව**

## තාලම්පට උපත

සීල නැමති ඇදුරෙක් සළු සඟල ලිහා අඳිමින් නේ
කෝල නැතිව කවියට ගත් පද අල්ලා නටමින් නේ
බාල කතුන් ගී ගයමින් ටිං ටිං නාදයට ගෙ නේ
තා ලං පට ඔන්න එදයි තැනූ සැටිය අහපන් නේ

සූවිසි සත්පලමක් ලෝකඩ උනුකර ගනිමින් නේ
මෙලෙසින් විස්කම් සුරිඳා පලුකර බෙදමින් නේ
ඇවිදින් මාතලි දෙව් පුත් ටිං ටිං නාදය දුන් නේ
එතැනින් විදමක් කපා මැඳහුය අදිමින් නේ

විසි සත් පලමක් ලෝකඩ උනුකොට දෙකකට බෙද ලා
යෙදූ සත් සර පංචමයෙන් කිරල් නාදයට සිරි ලා
හුයසත් පටකින් අඹරා ලනු දැතින් අල්ලා ලා
තාලම් පට ගැසූ එදා සම්මත මුල පටුන් බ ලා

(සේදරමන් ජේ.ඊ. 1979, උඩරට නැටුම් කලාව, කොළඹ : ඇම්.ඞී. ගුණසේන 41, 42 පි.)




**Cymbol Player, Rakava Viharaya, 19th Century Pl CXXV (Manjusri LTP 1977, Design Elements from Sri Lankan Temple Plantings, Colombo Archaeological Society of Sri Lanka**





**Thalampata player (middle), The Seductive Forces, Subhodharama Viharaya, Karagampitiya**.

## Rabana- Historical Evidences

(Kulathilake C.De .S, 1984/85 ,Raban Sellima and its Music, Journal of royal Asiatic Society (C.B.) Colombo ,Vol XXIX, 19-32p)

Raban has been introduced from South East Asian countries. This instrument appears in Thailand as Rammana, and in Malayasia as Reban and also Raban. The name Raban does not appeare in any list of Indian music instruments. Neither do the long lists of musical instruments of Thupavamsa, Pujavaliya or Dalada Siritha accommodate this name Raban. Ekas- bera, the one faced drum may refer to another type of instrument.

The following verse taken from the *upat-kavi* of Raban play traces the origin of Raban-play in Lanka to the reign of King Vijayabahu (1055 AD) probably the founder of Polonnaruwa.

*Palamuva me laka tula*
*Vijaba nirindu rajakala*
*Viva bandina kala*
*Raban nertaya lakata viya mula*

(for the first time in Lanka, it was at the wedding of King Vijayabahu that the Raban-play originated)

Its main function in the past, associated with wedding festivity of King Vijayabahu.Accoring to Dr.Paranavithana in his 'Ceylon and Malayasia' ,before ascending the throne Vijayabahu lived in Rohana by the name of Kirthi. His father Buddharaja hailed from Malayasia (Java). During prince Kirthi's campaigns against the Pandyans in Lanka another prince by the name of Suriyanarayana who had affiliations with the Sri Vijaya dynasty of Sumathra helped him. This Suriyanarayana who later ascended the throne of Malayasia, in order to maintain the good will sent his doughter Tilokasundari to be Vijayabahu's Queen.



Figures of At- Raban players are widely portratyed in the paintings and carvings of the 18th and 19th centuries, specially the Temples of the Southern region of Lanka.



**Raban player,Aludeniya Door frame.**



**Rabana player, Painting from Kathaluwa Temple.**
**(Chatiwongs N.,et.al, 1990, Paintings of Sri Lanka Colombo: Archiological Survey of Sri Lanka, Central Cultural Fund)**



## රබාන

රබාන උපත පිළිබඳව සාම්ප්‍රදායික පුරාවෘත්තවල දක්වා ඇති ආකාරයට ඉසුරු දෙවිඳු සිහිනයෙන් කී පරිදි වනයට ගොස් සඳුන් රුකක් කපා එම කඳින් වඩුවෙන් එකක් වූ දිග පුළුළ මැන රෝදයක් ලියවා රබාන සාදන ලදි. සමක් ගසා රන් පටිවටට ගසා පිත්තල ඇණ තද කොට තෙදිනකට පසු සුරතට ගෙන තාල ගැසුවේ යයිද ප්‍රකාශතය.

ඒ බුරුල හරිමින
යොදලා ඔහු නැකතින
රන් පටි වටට ගෙන
එබූ පිත්තල කොමලි මොහොතින

අත් රබන් වාදනයේ දී ගායනා කරන ගායනා කිහිපයක් මෙසේය,

වරලසා පිලසෙ නීල මල් දමින් ගොතා සොබන
මෙදිගැසා සඳුන් තිලක ලමින් නළලතා
මහදසා මුකුළු සිනා බරින් යුතුවෙනා රාජ
සබගොසා කරති රැගුම් නිරිඳු සඳමිනා

තතතනම්දන /// තානා
සොඳ සුමිහිරි රසතාලම් - විරිදු කීම සිට පුරාණ
රාජ රාජ මැතිසබ පොබකරවන - සරසවිමුව තුළ

කුද දොං දොං හඬ පතුරා - හඬවා සුරතින රබාන
පද තාලම් ඉලංගමේ - සරඹ නැටුම් ගෙන රබාන
ත්‍රිවිධ ඥාණ විදුරූ - පඬි අපමහ ගෞතම නම් මුනිඳු
මෙබුදුඋන - ගෞතම නම් මුනිඳු
එදා ඒ ඇතු විදුමට ආවැදිහට
පුදා මෙ දලදෙක දීලා දෝතට

එදා එබුදු බව ලැබූ නාථාහට
පුදා වඳිමු අපි මල් ගෙන දෝතට
ත්‍රිවිධ ඥාණ විදුරූ...

(දේශීය වාද්‍ය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ, ජාතික අධ්‍යාපන ආයතනය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 42, 43 පි.)

රබන් පද ප්‍රධාන වශයෙන් සුරල්, තාලම්, අත්මාරු වශයෙන් තුනකි. පහතරට ප්‍රදේශයේ රබන් වැයීම බහුලව කෙරේ. සුරල් යනුවෙන් දක්වන්නේ කීප දෙනෙකු එකතු වී වයන අත් වලින් කරන රංගනයයි. ඉතිරි අය පදය තාලයට වයති.

### තාලම්

තාක්ක දික්කුන් තදිනක දික්කුන් තාක්ක සුරේ    තා
අක්කා දැලේ සෙල්ලන් කරමින් නේත්‍රා ජිං ජිං    තා
අහස් තලේ බුදුරජාණන්ගේ ධර්මය පූජිත්    තා
පාත්තරේ දැන් පුරවා දෙන්නට නේත්‍රා ජිං ජිං    තා

අත්තක සුදු මල් අත්තක රතු මල් සෑය රුවින්    දිලිතෙයි
පැත්තක බුදුරුව පැත්තක දෙවි රුව සෑය රුවින්    දිලිතෙයි
තත්තත් ජිජිකුඳ රුපියල් සවුදම ටං ටිං ගා දොර    හරිතෙයි
සත්තයි මේ සබ සිටිනා කෙනෙකුට කිසිම හිඟක්    නොමවෙයි

### අත්මාරු

රත්තරන් මුද්ද හොඳයි ගල් තුනකුත්    එක්ක
මුදද ගන්න කැමති කෙනෙක් එනවද මා    එක්ක
දකුණ හුරුයි දෝංතා වමත හුරුයි    දොංතා
දකුණ හුරුයි වමත හුරුයි දෙකම හුරුයි    දොංතා

කුං දත් තරිකිට කොහොවිල ///
කකුඳ කකුඳ මල, වටම, වටම, මල වට ජල මැද්දේ
ගණිත කැලේ මැද කුකුදන් තල මල
තත්තත් තොන්ජින් තාල උදාරං
මාණික කිම සවුදං

දන්නේ නැත්නම් මාණික් අහපං දසවිද සුර සව්දම්
කච්චි කොළඹ කසා කොළඹ
තිප්පිලි මල් දෙකේ ළමයි
ඒ සුවේ මේ සූවේ අඬා වැටෙන දොරේ ළමයි

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 188 පි.)



## ජන ගායනා

### ඔංචිලි වාරම්

මිතුරු මෙනුඹ අප එක්ව    සියල්ලා
කතුරු ලෙසට බැඳ රං    ඔංචිල්ලා
නතර ලමින් ගුවනේ    ඔංචිල්ලා
මෙවර පදිමු අපි රං    ඔංචිල්ලා

තුටුව උඩින් සිට බැඳ    ඔංචිල්ලා
පිට පිට පැගුවෙ එකර    කැවිල්ලා
වට පිට සිටි අය බලා    සිටිල්ලා
අට දෙන අට කොන වාඩි    වෙයල්ලා

උඩම උඩම උඩ මක්කම    වැල්ලේ
වසින වසින වැසි ඒ ගල    පල්ලේ
දුවන දුවන නැව් සමුදුර    එල්ලේ
අපිත් පදිමු දැන් රං    ඔංචිල්ලේ

අට දෙන අට කොණ වාඩි    වෙයල්ලා
සිටගෙන දෙන්නෙක් පොලු    පාගල්ලා
වවුලන් ලෙස කැරකෙන    ඔංචිල්ලා
අපිත් පදිමු දැන් රං    ඔංචිල්ලා

පදින කලට අඟනෝ    ඔංචිල්ලා
අඳින සළුව තදකර    ඇඳගල්ලා
තදින අතින් වැල් අල්ලා    ගල්ලා
සොඳින වරල බැඳගෙන    පැදපල්ලා

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 185 පි.)

## Onchilli Waram

| | |
|---|---|
| *inda gathemi usa putuvaka* | *guvana* |
| *banda gaththemi jaya kondaya* | *muduna* |
| *anda gaththemi vathakuth* | *abarana* |
| *vada gaththemi Narayana* | *sarana* |

(Sat on a chair high up, knotted my hair, adorned my self with garments and ornaments and I sought refuge in god narayana)

(Kulathilaka C. De. S. 1976, A background to Sinhala Traditional Music of Sri Lanka, Abeysinghe.R. 23 P)

## Paru Gee (Seepada Style)

| | |
|---|---|
| *Male male ara namala nela* | *varen* |
| *Aththa bendei paya burulen thaba* | *varen* |
| *Kelani gange oru yanawa bala* | *varen* |
| *Sadukara dee oruwaka nagee* | *varen* |

"Brother brother! pluck that 'na' flower, tread lightly on the bough lest it will break, watch the boats plying in the Kelani river and come in a boat with shouts of joy...

(Kulathilake and Abeysighe ,1976, A Background to Sinhala Traditional Music of Sri Lanka Department of Cultural Affairs Sri Lanka)

## පාරු කවි

| | |
|---|---|
| මොකටද උපන්නේ මේ වේලිච්ච | රටේ |
| බැඳපු ගල් බැම්ම මයියන්ගනේ | වටේ |
| ඔරුවට නැගීලා සුරතට රැගෙන | රිටේ |
| පාරු පදින හැටි බල වේර ගං | තොටේ |

| | |
|---|---|
| සීරුව බිමට කනුකොට සිටුවා | මහත |
| වාරුව ඇතිව දියපිට තැනූ ගෙයක් | ඇත |
| මාරුව තැනින් තැන බඩුගෙන ගමන් | යත |
| පාරුව වැනි දෙයක් මේ මුළු ලොවේ | නැත |



## පතල් කවි

| | |
|---|---|
| මිනිරන් කන්ද පාමුල ගමරා ගෙද | ර |
| එමරන් ගෙන යන්න කැපුවේ මහ පා | ර |
| වතුරෙන් සැප සොඳයි කුඹුකේ ළිඳ වතු | ර |
| ගන රං රුවයි මිනිරං කන්දේ ගෙද | ර |

| | |
|---|---|
| දුම්බර කන්ද පාමුල මිනිරං පත | ලේ |
| බැසලා බඹ තිහක් කළු ගල සිදුරුක | ලේ |
| බස්නාහිරට දෝනා දෙක පසා ක | ලේ |
| විස්තර කියමි දුම්බර මිනිරං පත | ලේ |

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 192 පි.)

## දරු නැලවිලි කවි

| | |
|---|---|
| උකුලෙහි දඟකර කර කිරි බී | ලා |
| වැටි නැටි ඇවිදින දනබිම ගා | ලා |
| දකින දකින අයට නුඹෙ පියකරු ලී | ලා |
| වෙන සැප කුමටද ලල ලල ලා | ලා |

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 193 පි.)

## කුළු කවි

| | |
|---|---|
| මුදුනට වරලස පීරා | බැන්දේ |
| ගෙලවට මිණි මුතු මාල | පැලැන්දේ |
| තද කොට සළු පිළි ඉනවට | ඇන්දේ |
| කදිමට කුළු ගෙන රඟ දෙමු | ලන්දේ |

| | |
|---|---|
| ඇත සිටන් එන්නේ සෙල්ලි | සෙල්ලියේ |
| මෑත සිටන් එන්නේ සෙල්ලි | සෙල්ලියේ |
| අතේ පයේ ගිගිරි වළලු | සෙල්ලියේ |
| රොඩී ගමට නායක රත්න | වල්ලියේ |

රන් ගිරි මුදුනේ හිරු බබ ලන්නේ
වල්ලි ලඳුන් හනි හනිකට එන්නේ
අව්වද වැස්සද කියා බලන්නේ
කුල්ල අරන් අපි නැටුමට එන්නේ

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 193 පි.)

### කළගෙඩි කවි

ජලේ සොඳයි බැසලා පීනන්නට
විලේ සොඳයි මල් ගැබ මෝරන්නට
මිලේට වත් කළ දීලා ගන්නට
කලේ හොඳයි මේ ළඳට පිඹින්නට

නෙළුම් නෙලාලා ගෙල පළඳාලා - දෝත පුරාලා කුසුම් පුදාලා
සුරලොව රැජිනගේ සළුව තබාලා - පාමුල කළගෙඩි මාලෙ නටාලා

කිංකිණි ජාලා දෙපා නගාලා
කුංකුම චන්දන ඇඟ ගල්වාලා
තුන්පට සාරිය ඉන ගවසාලා
සුන්දර සුරඟන රඟ දෙනලීලා

මිණිමුතු පබළුද කිරිසුදු පාටයි
ඊට වඩා අපෙ මව සුදු පාටයි
පැහැපත් ඇගෙ සුදු දුවලගෙ පාටයි
කළගෙඩි නැටුමත් අවසන් පාටයි

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 193 පි.)

### බඹර කැපීමේ ගී

ගඟට යන බඹරු ඉටි හැර ගෙනියද්දා
මලට යන බඹරු මල්ලක් ගෙනි යද්දා
දියට යන බඹරු කලයක් ගෙනි යද්දා
යන්නට බඹරු මැසිවිලි කියද්දා



කඳන් පැලීලා කඳහතු පිපෙන්නේ
පොළොව පැලීලා වැලිහතු පිපෙන්නේ
දොළදුක වෙලාවද දරුවන් වදන්නේ
මන්ද කළුහාමි දරු දුක නොදන්නේ

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 190 පි.)

### ගොයම් කවි

රන් දැකැති ගෙන නිති සැරසන වා
රත්තුං පටි ඉන වට දිලිදෙන වා
රිවිදුටු පිනි බිඳු ලෙස පහ වෙ වා
දුම්බර කෙතේ අපි ගොයම් කපන වා

උදේ සිටන් වකුටු කොන්ද දිග හැර පල්ලා
අතේ තියෙන ගොයම් මිටිය බිම දම පල්ලා
හිසේ තියෙන ලේන්සු පොඩිය අතට ගනිල්ලා
සතර වරම් දෙවි පිහිටෙන් ගොඩට යමල්ලා

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 190 පි.)

### කරත්ත කවි

වයිර ගොනා දණ ගහලා අදින කොට
මයිල ගොනා පැන්නයි පස්සට හොරට
මොකද කරන්නේ පූරුවෙ කල පවට
පව් කල ගොනෝ ඇදපන් ගාල ගාවට

බතට කන්ට බැරි බතලේ ගල කන්ද
අලට කන්ට බැරි අල ගල්ලේ කන්ද
හුනට කන්ට බැරි හුන්නස් ගිරි කන්ද
මේ කඳු තුනට නායක සමනළ කන්ද

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 190 පි.)

### පැල් කවි

වෙලක මහිම බල මා වී පැසීලා
පැලක මහිම බල බට කොළ සොයාලා
මලක මහිම බල අතු අග පිපීලා
ලියක මහිම බල ගෝමර ඉසීලා

වෙල හොඳ මොකද යල මහ පාළුවේ නම්
පැල හොඳ මොකද පොද වැස්සට තෙමේ නම්
මල හොඳ මොකද අතු අග පරව යේ නම්
ලිය හොඳ මොකද ඉසි ගෝමර මැකේ නම්

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 191 පි.)

### නෙළුම් ගී

සෙතක් ලැබේවා තිසරණ සරණින් හැමවර
මෙලක් දිවට අධිපති සැම නිරිඳුන් අවසර
දොසක් ඇතත් එය හැර සෙත සලසනු නිරතර
මදක් කියමි නෙළුම් තහන්චිය මම කවි කර

කැකුළු තිසර ඔසරි පටින් වසාගෙන
රුපුරු වළලු දෑතේ තද දීගෙන
මැදලා පුස් කොල තෝඩු තියාගෙන
වෙල මැද නෙළුමට යමු සැර සීගෙන

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 192 පි.)

### පන් කවි

ආල වඩන රුව ඇති ලඳ දුටුවිට
ලීල ඔමරි කම් පානා සතහට
වේලා කපා බැඳගති ගෙන එන්නට
රත්න ගිරෙන් යමු පන් උදුරන්නට



ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මූණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනුවන් පන් තිබෙන කොට
නෑනේ උඹත් එනවද පන් කපන්නට

(ප්‍රේමතිලක. නිමල්, 1991, අපේ දේශීය නැටුම් කලාව, බණ්ඩාරගම, නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ, 192 පි.)

## Poetry connected with games and amusements.

### *Kalagedi* dance

*'Kalagedi Malaya'* gives verse singing at a dance where the dancers carry pots.

**කලගෙඩි කවිය**

ගොපලු එරන් මාලේ කරලා ගෙණ
රුවැති වලලු ගෙන දෑත දරා ගෙණ
ඔසරි පටින් තන රන් තැටි වහ ගෙණ
පිඹින කලේ ගෙන දෑත දරා ගෙණ

*With the beaded golden chain round the neck*
*With lovely bangles worn on both arms*
*With the robe thrown across the golden breasts*

(W Arthur De Silva 1915-1916 the Popular poetry of the Sinhalese ,Journal of royal Asiatic Sosiety (C.B.) Vol XXIV, No 68, Part I, 27-60p)

### *Li Keli* (stick dance)

*Li kely sangarawa* gives verses sung to the accompaniment of the stick dance.

## ලී කෙළි

ලොල්ල වඩන සදෙනෙක් එක් වන්නේ
ගොල්ල සැමට ඇසෙනට නද දෙන්නේ
දුල්ල වඩන සෙල්ලමකි බොලන්නේ
මල්ලි වරුනි ලී කෙලිමුතින් නේ

*Six attractive persons will assemble*
*And will sing and play to that all my-hear*
*This is a game that pleases all*
*Little brothers let us continue the stick dance.*

(W Arthur De Silva 1915-1916 the Popular poetry of the Sinhalese ,Journal of royal Asiatic Sosiety (C.B.) Vol XXIV, No 68, Part I, 27-60p)



**Li Keli Dancers, Stone Carvings from Hangurnketa Templ**e.
**(Dissanayaka SB 1997 Diyathilaka Nuwara. Colombo: Dept of Archeology)**



## ප්‍රශස්ති කාව්‍ය

පැරණිම ප්‍රශස්ති කාව්‍ය ලෙසට සැලකෙනුයේ කෝට්ටේ පැරකුම්බා සිරිතයි. සෙංකඩගල රජ පැමිණි දෙවන රාජසිංහ රජු සමයේ රචනා වූ රාජසිංහ සිරිත, පවන, මහ හටන ආදී ප්‍රශස්ති කාව්‍යයද නරේන්ද්‍රසිංහ රජු පිළිබඳව ලියැවුණු ශෘංගාලංකාරයද මෙම ගණයේ ලා ගැනේ.

**පැරකුම්බා සිරිත**

පැරකුම්බා සිරිත විරිදුවකි. රජකු පිළිබඳව තුති මුවින් කැරෙන ගුණ ගැයුම විරිදුවයි. රජුගේ ගුණ ගැයූ කවියා ඒ ගුණ අතිශයෝක්තියට නැගීය. එතුමා අන් සියලු නරයන් පසුබා සිටියේ පමණක් නොව, සෙසු නරපතින්ද ඒතුමාට යටත් වූහ. හෙතෙම දෙවියකු හා සමාන වීය.

පැහැදි සරම්බා රැඳි මනරම් බා
තුනු සිරි රම්බා පති පිළිබිම් බා
රැපු රජ රම්බා රන මතකුම් බා
දින පැරකුම්බා හිමි තෙවිකුම් බා

ලක තුන්රට මුළු දඹදිව පිළිබඳ
නිරිඳුන් බිගුකැන් ගුණ සුවඳින් සොඳ
අවුදින් ගෙනැ යන රන් මිණි මුවරඳ
මෙරදුන් සරණත තඹරෙකි මනහඳ

රකුම්බා සිරිත, 30, 32 පද්‍ය

(කුලසූරිය, ආනන්ද, පැරකුම්බා සිරිත 5, 12 පිටු, සන්නස්ගල සහ ගුණසේකර, 1996 (සංස්) සාහිත්‍යය ත්‍රෛමාසික සඟරාව, 2, 3 කලාප, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව)

### විරිදුකවි ලක්ෂණ දැනවෙන පද්‍ය

දද මුතුලැල් සිසි බිම්බා කුඩ නඟමින් දිගු යටතේ
බැඳ මින්දද නුබ ලම්බා දික් විජයට ගෙන සෙනෙගේ
නද කෝකිල සක් සුම්බා මලවිය නල අසුට නැගේ
අද නරනිඳු පැරකුම්බා නොලැගෙනු කිම වරද මගේ

උදහස් ගුණය දැන පැරකුම් නරනිඳුගේ
ඒදවස් පටන් මද යුදයට නලසු නැගේ
සඳරස් හිම සඳුන් සිසිලස ය යුගතගේ
සෙදගොස් මෙ තතු කිය සකි නරනිඳුට මගේ

(පැරකුම්බා සිරිත 134, 132 පද්‍ය)

(කුලසූරිය පැරකුම්බා සිරිත 5 - 13 පිටු සන්නස්ගල සහ ගුණසේකර, 1996 (සංස්) සාහිත්‍යය ත්‍රෛමාසික සඟරාව 2,3 කලාප, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව)



**King Bhuvanekadhahu VII of Kotte, Casket -2, Residenz, Munich, Schatzkammer ,Inventory No 1242, Inventory no :15x 25x14cm , 1547 AD**



## රාජසිංහ සිරිත I සහ II

මෙම කාව්‍ය දෙක ක්‍රි.ව. 1635 සිට 1687 දක්වා ලක් කිරුළ දැරූ දෙවන රාජසිංහ රජු ගුණස්තවයෙන් පුදනු සඳහා ලියැවුණු ප්‍රශස්ති කාව්‍ය දෙකකි. සාමාන්‍ය ජනයා අතර රාසිං දෙවියන් වශයෙන් මෙතුමා ප්‍රසිද්ධව සිටියේය.

ගන්නෝරුවේ වාඩිලාපු පරංගි ජනයා සමඟින
වන් තද වේගයෙන් යුදට රකුස් කැලන් ලෙසින් සෙදින
රම් රද සේ රාජසිංහ නිරිඳු වැදී සෙන් සමඟින
දුන් බැට මේ කප පවතින යුදයකි ඉර හඳේ අඳින

**(ii - 27 පිටුව)**

ළතර ඔළ මොළ රඳන රැපු නෙක මහත් තුඟු කොට පෙළින් පරසිඳු
සපර ගමු මල්වානයද තර මැණික් කඩවර සමඟ අනිකුඳු
විතර නොමකර යුද එකින් එක බිඳැර සෙන් අල්වමින් ඔවුනුඳු
කුමර කෙළි රණ කෙළි කෙළපු නර වීරයෙක් රාජසිංහ නරනිඳු

**(ii - 19 පිටුව)**

යුද්ධ බේරි වැයුම් කර පුම්බවා දළහං මිහිඟු සක් බෙර
බද්ද මේරී දිනා පත් රණ වතුරු අරතර කොළඹ පුරතුර
යද්ද දූරි කර ලූ සඳවර පවර රජසිහ නරන පුවතර
අද්ද නාරී ඉසුරු සිරිගති එවර සිරිලක් දෙරණ මනහර

**(i - 20 පිටුව)**

(මීගස්කුඹුර, පුංචි බණ්ඩා, රාජසිංහ සිරිත iසහii, 29 - 39 පි, සන්නස්ගල සහ ගුණසේකර, 1966 (සංස්) සාහිත්‍ය ත්‍රෛයි මාසික සඟරාව, 2,3 කලාප, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව)



**King Rajasimha II ( Knox, R.1966.Historical Relation of Ceylon.Colombo: Tissara Prakasakayo)**



## ශෘඞගාරය - ශෘඞගාරාලඞකාරය
## හෙවත්
## නරේන්ද්‍රසිංහ රාජස්තුති (ක්‍රි.ව. 1732)

හිමිකත් කොපුලත් එකයුත් ගිරපත් විය සට්පද රැව් හඬ අමිනිස්
වනසත් යහනත් සෙනෙරත් වදිනෙය සඳුනුත් ලෙව්වෙර ගිම්සිළු වෙස්
සියපත් සිය හොත් මිහිනත්වර අප නරේන්ද්‍රසිංහ හිමි දැක නොවලස්
අදවත් මෙපවත් සකිසත් ගුණයුත් සිතැතොත් මට කිය දැන් අදහස්

**(ශෘඞගාරාලඞකාරය 3)**

(සුමන ජෝති, දෙගම්මැද. 91, 103 සන්නස්ගල සහ ගුණසේකර, 1966 (සංස්) සාහිත්‍යය ත්‍රෛයි මාසික සඟරාව, 2,3 කලාප, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව)

### ප්‍රශස්ති ගීත

වරමාති ශුභ චරිතේ - ලංකා පති නරේන්ද්‍රසිංහ නෘපතේ//

හෝජ රාම සම තේජ හිරාමා රාජ කාම රණ භූෂණ සෝමා
චන්දත් කුලධෘති චන්දහිරාමා නරේන්ද්‍රසිංහ නර නායකභූමා
වරමාති ශුභ චරිතේ............

දුර්ජන දුෂ්ට විභංජන තෝපා - සජ්ජන සත්ථ සුරක්ෂ
මනාපා වර්ජිත රිෂ්ඨා චද්‍යුෂ පාසා අර්ජුන භූභූජ ශ්‍රී ධර චාපා
වරමාති ශුභ චරිතේ ...............

රංසි මාල තුල අර්නව ගීරා අංශු මාත්‍ර සන්තෝසන තාරා
නන්දන වදු

තනු රාමාව තාරා හිංසා අභීසෝ සාසන ධීරා
වරමාති ශුභ චරිතේ.................

තරු රත්න සිරි නිත්‍ය - නව රත්න සහ මත්‍ය ////
වරුණ භය රණ බරණ දායක
විජය පිරිවර නරේන්ද්‍ර සිංහ මෙ
තරු රත්න ........... //

තරඟ ගඟ රඟ අමර සුරවර බරණ ගිරිහර බරණ උරතල
ශ්‍රී සුභ මස්තු පත්//

බුද්ධ වාර රාජ සිංහ මේ ///

නොමඳින් විකුම් පාලා - සැදෙමින් යුදට ජය ලන්දේසීන් සමඟින් එපන රාළා

ගංගා මුදුන දැරූ - රංගා යුහුරු රණ රංගා පිවිස මානා//
යුද්ධෙටත් ඇවිත් සිදු පිට නැව් නැඟිලා පරංගි
උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැහැලා
අන්දමත් හොඳයි කිසි බී සී ගාලා
කොළඹදි කම් පලත් නැතත් සෙනඟක් මරාදාලා
වරමාති ශුභ .................

(ප්‍රේමතිලක නිමල් 1991 අපේ දේශීය නැටුම් කලාව බණ්ඩාරගම නිමල් ප්‍රේමතිලක සහ ප්‍රකාශකයෝ 195 - 196)

## දළදා වත

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දන්ත ධාතූන් වහන්සේ හා සබැඳුණු දළදා අෂ්ඨකය, ධාතු වැඩමවීම හා දළදා සින්දුව යනාදී කාව්‍ය දළදා දළදා වහන්සේට පූජා පිණිස බෙර වයා රිද්මයානුකූලව ගායනා කරනු ලැබේ.

## දළදා අෂ්ඨක

බෙර පදය - දොම් ජිජි ගත - මැදුම් තනි තිති - කඩිනම් ලය 123/ 123

ශුද්ධා ගුණ සුද්ධෝදන නරපති කුල මහිම ම්
බුද්ධාගම මහමායා දේවීධර ප්‍රසූත ම්
විද්‍යාධර සකලා ගම නිපුනා බහු පයී න
ශ්‍රී ගෞතම දාඨාමුනි පුන මා මිත සරනා

සූවිසි මණ්ඩලයක වැඩ සිට ලා
සූවිසි අසංකය නිවනට හැර ලා
කුසිනාපුර උයනට වැඩ ලා
පිරිනිවි පන්සාලිස් වස ගෙව ලා

සිව් සෙන් සමඟින් මල්ලව රජ රැස් වේනනේ උයන මැද
දෙව් විමනක් මෙන් සරසා නිමකර මින්නේ එකතු ලද
කව් සෙහි නව වත් සිය සිය පට වසමින් නේ එබුදු බඳ
දැව් වන්දන දරු සෑයට වැඩ විගසින් නේ සිතින් ලෙඳ



තිදසක් නා ලොව සිංහල දෙස ගංධාර සතර ද ළ
සිරිමත් සිංහල සෙන්කඩ ගල මනු ධාරා දකුණු ද ළ
පිරිසක් ගජභය පසතුරු නද ගම්බීරා කරණ පෙ ළ
හරිනුත් මහ පුද කරවති වැඩ කර වීරා සෙංකඩග ල

## ධාතු වැඩමවීම

බෙර පදය - දොම් දො ජිං ගත - මධ්‍ය ලය - මැඳුම් මහ දෙතිත 123 - 1234

සදා අපෙ මුණි සසුන සිරිලක මිහිඳු මහ තෙර වඩිමිනා
පුදා ගැනුමට ධාතු ගෙන්වා වෙලක් නිරිඳුට තැනා
වැඳා නරනිඳු ධාතු පිළිගෙන කොලෝ පුද පෙල සරස නා
ධාතු කරඬුව හිස තැබීමට කර වැඳ ආරාධ නා

සිද්ධ පසතුරු නාද වයමින් ශබ්ද ඝෝෂා කරවමි නේ
සුද්ධ සිංහල සිරිත් ඇඳුමෙන් බුදුන් තේවට සැරසෙමින් නේ
ශබ්ද නගමින් සෙනඟ වට සිට සාදුකාරය දී ගොසින් නේ
බුද්ධ රත්නය පැහැද නමකර ධාතු කරඬුව හිස තබන් නේ

මංගලම් කවි සින්දු වන්නම් නොයෙක් සවු දම් බස කියන්නේ
අංග චලනය පපා සමහරු නෙර්ත සවුදම් බස කියන්නේ
ඉන්ම සළකා සුවඳ මල් ඉස සාදුකාරය දී ගොසින්නේ
ධර්මරත්නය පැහැද නම කර ධාතු කරඬුව හිස තබන්නේ

නිම්ම නැති මහ සෙනඟ රැස් වී පහන් ආලෝකය කරන් නේ
නම්ම ගෙන පිනට විසිතරු උඩු වියන් පාවාඩලන් නේ
ඉන්ම සලකා සුවඳ මල් ඉස නොයෙක් පුද පෙල හර කරන් නේ
සංඝරත්නය පැහැද නමකර ධාතු කරඬුව හිසතබන් නෙ

(වෛද්‍යවති, රාජපක්ෂ, 2002, දළදා මාළිගාව සහ තූර්ය වාදනය, ඒස් ගොඩගේ, 164 - 165)



Musicians from Haguranketa Temple (Manjusri LTP 1977, Design Elements from Sri Lankan Temple Plantings, Colombo Archaeological Society of Sri Lanka





**King Kirthi Sri Rajsimha (Temple of Dambulla)**



**A Dutch embassy to Kandy ‘ dakuma’ in 1785 (Roberts.M 2004, Sinhala Consciousness in the Kandyan Period 1590 – 1815, Colombo: Vijitha Yapa Publications.**





**King Sri Vikrama Rajasimha (Davy, J. 1821. An Account of the Interior of Ceylon and of Its Inhabitants, London: Longman,p.107)**



**King Sri Vikrama Rajasimha, Asgiri Viharaya Kandy**





**King Sri Vikrama Rajasimha, Museum of Kandy**